වීරකැටිය ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ (උ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී අත්පත්කරගත් හා ඉදිකර තිබූ ඉඩම්, ගොඩනැගිලි හා මිලදීගෙන තිබූ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ එකතු වටිනාකම රු.මිලියන 2.54 ක් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීම යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කරන බව.	අත්පත්කරගත් හා ඉදිකර තිබූ ඉඩම්, ගොඩනැගිලි වටිනාකම හා මිලදී ගෙන තිබූ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ 2025 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දරණ ලද එකතු වටිනාකම රු.163,876 ක් වූ පුනරාවර්ථන වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.	පුනරාවර්තන වියදම් වැරදීමකින් ප්‍රාග්ධන වියදම් ලෙස සටහන් වී ඇති බව.	ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(ඇ)	එකතු වටිනාකම රු.761,561 ක් වූ වියදම්, උපචිත වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීම් සිදු කරන බව.	ණයහිමි ප්‍රතිපාදන ඇති නොකරන ලද රු.761,561 ක් වූ වියදම් 2025 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම රු.4,442,464 කින් අඩුවෙන් ද ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.246,556 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීම් සිදු කරන බව.	මුද්දර ගාස්තු ආදායම් හා ලැබිය යුතු ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	වටිනාකම රු.987,966 ක් වූ වැඩ නිම කිරීම් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබියදී ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගතකර තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීම් සිදු කරන බව.	වැඩියෙන් ගිණුම්ගත කරන ලද කර්මාන්ත ණයහිමි ශේෂය නිවැරදි කළ යුතුය.

(ඊ)	ඉකුත් වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලද වටිනාකම රු.85,218 ක් වූ ලීටර් 1000 ජල ටැංකි 07 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.	2025 වර්ෂයේ දී අදාල නිවැරදි කිරීම් සිදු කරන බව.	පරිත්‍යාග වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගන්නා ලද රු.641,226 ක් වූ ආරක්ෂිත ඇප තැන්පත්, සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේ දී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කරන බව.	සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	ඉකුත් වර්ෂයේ ණයහිමි ගෙවීම් රු.මිලියන 1.27 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.	ඉදිරියේදී ගෙවිය යුතු වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	වැඩියෙන් ගිණුම්ගත කරන ලද රු.මිලියන 1.27 ක වියදම් නිවැරදි කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.මිලියන 37.39 ක වෙනසක් පැවතුණි.	උපයෝගී ලේඛනයන්හි ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	උපයෝගී ලේඛන යාවත්කාලීනකර ගිණුම් ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.මිලියන 49.11 ක්වූ ගිණුම් විෂයයන් දෙකක් අදාළව ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරිදි සත්‍යාපනය කිරීමට නොහැකි විය.	ලේඛනයක් නොමැති බවත් පවත්වා ගැනීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ස්ථාවර වත්කම් ලේඛන විගණනය වෙත ඉදිරිපත් කල යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වගන්තිය	වර්ෂ 05 කට වරක් වරිපනම් දේපල තක්සේරු කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2002 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි.	2025 සිට නව තක්සේරුව ක්‍රියාත්මක කරන බව.	යොමුගත රීති ප්‍රකාරව වර්ෂ 05 කට වරක් වරිපනම් දේපල තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට කරනු ලැබූ සංශෝධන	සමාලෝචිත වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ඒකක 16 ක් එය ලබා නොගැනීම නිසා සභා අරමුදලට රැස්කළ හැකිව තිබූ රු.72,000 ක ආදායමක් අහිමි වී තිබුණි.	මෙම ව්‍යාපාර ඒකක සඳහා ලිඛිතව දැනුම් දීම් සිදු කර ඇති බව.	පාරිසරික පනතේ විධිවිධාන අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ආයතන 16 සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කල යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 67.51 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 41.19 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	3,847,500	16,957,935	17,552,624	3,761,508	3,835,000	3,744,817	4,907,714	4,356,197
කුලී	40,237,200	43,474,276	45,518,745	6,588,509	31,582,600	62,201,239	72,307,611	8,632,978
බලපත්‍ර ගාස්තු	2,813,000	3,795,516	3,463,781	721,818	2,155,000	3,320,755	3,494,147	390,083
වෙනත් ආදායම්	64,382,280	26,064,972	26,078,861	-	14,523,000	15,985,664	15,971,775	13,889
එකතුව	**111,279,980**	**90,292,699**	**92,614,011**	**11,071,835**	**52,095,600**	**85,252,475**	**96,681,247**	**13,393,147**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් ඒකක 2235 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.මිලියන 3.4 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	වරිපනම් බදු රු.514,421 ක් අයකර ගත් බවත් ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තියට ප්‍රකාරව වරිපනම් බද්දක් සභාව විසින් විධානය කරනු ලැබිය හැකි කාල සීමාව ඇතුළත නොගෙවනු ලැබේ නම් හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා ලේකම්වරයා විසින් අත්සන් කරනු ලබන බලපත්‍රයක් මගින් සභාවේ නිලධාරියෙකු වෙත බලය පවරමින් එම හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, හිඟ ශේෂය රු. 5,000 ට වැඩි දේපල හිමියන් 164 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.මිලියන 1.19 ක් අයකර ගෙන නොතිබුණි.	රු.158,349 ක් අයකර ගෙන ඇති අතර තවදුරටත් අයවිය යුතු හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඇ)	ලැබිය යුතු කඩ කුලී හා ලැබිය යුතු පොල බදු රු.මිලියන 6.59 ක් අයකර ගෙන නොතිබුණි.	කඩ කුලී රු.18,000 ක් හා පොළ බදු රු.929,305 ක් අයකර ගත් අතර ඉතිරි හිඟය සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඈ)	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සවි කර තිබූ දැන්වීම් පුවරු වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු රු.709,310 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි.	දැන්වීම් පුවරු ගාස්තු රු.596,060 ක් අයකර ගෙන ඇති බව ද ඉතිරි හිඟ මුදල සඳහා නඩු පවරා ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

(ඉ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.මිලියන 3.34 ක් හා රු.මිලියන 58.05 ක් විය.	උසාවි දඩ මුදල් හිඟයෙන් රු.මිලියන3.29 ක් අය කර ගෙන ඇති අතර, ඉතිරි හිඟ මුදල් කපා හැරීමට යොමුකර ඇති බවත්, මුද්දර ගාස්තු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර තුමා හා ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය සම්බන්ධීකරණය කර මේ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හදුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘතීන් 03 ක් නිමකිරීමට සභාවේ යන්ත්‍ර හා වාහන නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2014 වර්ෂයේදී ලබා දී තිබුණි. ඒ වෙනුවෙන් සභාවට රු.906,429 ක් ලැබිය යුතුව පැවතුණද ඉන් රු.413,529 ක් ගෙවිය නොහැකි බවට සභාවට දන්වා තිබීමෙන් කුලී මුදල් නිසි පරිදි අයකර යන්ත්‍ර හා වාහන ලබා නොදීම නිසා සභා අරමුදලට සිදුව තිබූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	හිඟ මුදල් ගෙවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇති බවද, එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	සභාවට අයවිය යුතු රු.413,529 ක ආදායම අයකර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වීරකැටිය පොදු වෙළඳපොල බදුගත් බදුකරු විසින් 2007 වර්ෂය සඳහා ගෙවිය යුතු රු.820,558 ක මුදලක් නොගෙවීම මත බදුකරුට එරෙහිව නඩු පවරා තිබූ අතර එයට අදාළ M – 687 දරන නඩු තීන්දුව අනුව හිඟ බදු මුදල, නීතිඥ ගාස්තු සමග බදුකරුගෙන් අයකර ගන්නා ලෙස 2019 නොවැම්බර් 28 දින තීන්දු කර තිබියදී විගණිත දිනය වූ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තීන්දුව ලැබී වර්ෂ 05 ක් ගතවී තිබුණද එකී මුදල අයකර ගැනීමට සභාවේ කළමණාකාරීත්වය කටයුතු කර නොතිබුණි.	ගාස්තු අයකර ගැනීමට අදාලව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන ලෙස නීතිඥවරයා වෙත ලිඛිතව දැනුවත් කර ඇති බවත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	අදාළ නඩු තීන්දුව වහාම ක්‍රියාත්මක කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබූ කර්මාන්ත 23 ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගැනීම නිසා සභාවට ලැබිය යුතු රු.103,500 ක් අයකර ගෙන නොතිබුණි.	කර්මාන්ත 06කට අදාල පරිසර බලපත්‍ර නිකුත් කර මුදල් අයකර ගෙන ඇති බවත් ඉතිරි කර්මාන්ත සඳහා ද බලපත්‍ර නිකුත් කර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව.	ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබාගැනීමට උනන්දු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමාණය අක්කර 24 පර්චස් 26.83 ක් වූ ඉඩම් 24 ක් හා වාහන 02 ක් සභාව විසින් පරිහරණය කරනු ලැබුවද ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් හා වාහන පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව.	සභාව පරිහරණය කරන ඉඩම් 24 ක හා වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ආ)	සභාව සතු ඉඩම්වල එළදා බදු දී ආදායම් රැස්කරගත හැකි වුවද, ප්‍රමාණය අක්කර 01 රූඩ් 03 පර්චස් 27.12 ක් වූ ඉඩම් 05 ක් එලෙස එළදා බදු දීමට කටයුතු කර නොතිබුණි.	එළදා බදු දීම සඳහා මිල ගණන් කැඳවා බදුකරුවන් තෝරා ගැනීමට කටයුතු කරන බව.	සභාව සතු ඉඩම් එළදායී කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රමාණය අක්කර 02 රූඩ් 02 පර්චස් 39.18 ක්වූ ඉඩම් 05 ක් අනවසරයෙන් භාවිතා කරනු ලැබුවද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉඩම් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු සිදු කරන බව.	සභාව සතු ඉඩම් අනවසරයෙන් භාවිතා කරන අය ඉවත් කර ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ඈ)	ධාවනයෙන් ඉවත් කර තිබූ සභාව සතු R2 Sakai වාහනය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	අපහරණය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව.	වාහනය අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වටිනාකම රු.මිලියන 165.13 ක් වූ වලස්මුල්ල බස්නැවතුම්පල ඉදිරිපිට කඩකාමර 14 සහ වටිනාකම රු.මිලියන 15.13 ක් වූ වීරකැටිය වෙළඳපල අසල කඩ කාමර වල ඉහල මහල සංවර්ධන කටයුතු නොකිරීම හේතුවෙන් ගොඩනැඟිල්ල විනාශ වෙමින් පැවතියද මේ සම්බන්ධයෙන් සභාව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2026 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කර අදාළ සංවර්ධන කටයුතු සිදුකිරීමට අපේක්ෂිත බව.	වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සංවර්ධන යෝජනා නිසි සැලැස්මකට අනුව සිදුකළ යුතුය.

(ඊ)	වලස්මුල්ල බස්නැවතුම්පල ඉදිරිපිට කඩකාමරයක් හා මහජන පොල ගොඩනැඟිල්ලෙහි අඩි 135 ක් දිග හා අඩි 25.3 ක් පළල විවෘත පෙදෙස කිසිදු භාවිතයකින් තොරව පැවැතිණි.	විවෘත පෙදෙස භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	වත්කම් සම්පූර්ණයෙන්ම හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

3.5 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ ක්‍රියාත්මක කරන ලද මාර්ග ව්‍යාපෘතීන් 02ක් ගිවිසුම්ගත වූ කාලය දීර්ඝ නොකිරීම මත අතරමඟ නවතා දමා තිබුණි.	අයහපත් කාලගුණය හේතුවෙන් කාලය දීර්ඝ කිරීමට ඉල්ලීම් කල ද, කාලය දීර්ඝ නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම්ගේ වාචික උපදෙස් පරිදි ව්‍යාපෘතීන්හි වැඩ අත්හිටවනු ලැබූ බව.	සංවර්ධන යෝජනා ගිවිසුම්ගත වූ පරිදි ඉටුකළ යුතු අතර සංශෝධන සැලසුම් සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ තනතුරු 02 කට අදාළ අතිරික්තතා 12 ක් විධිමත් කරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.	සංවර්ධන නිලධාරී තනතුරට අදාල අතිරික්තතා නිවැරදි කිරීමට සභාව සතුව හැකියාවක් නොමැති බව හා පරිගණක ක්‍රියාකාරී තනතුර අනුමත කර ගැනීමට කටයුතු කරන බව.	සභාවේ කාර්යය මණ්ඩල අවශ්‍යතාවයන් පිළිබඳ සමාලෝචනයක් සිදු කළ යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විධිමත් පරිදි ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම නිසා සභාව තුළ සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය අතුරින් නිලධාරින් /සේවකයන් 02 දෙනෙකු වසර 05 සිට 10 දක්වා වූ කාලපරිච්ඡේදයක් එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුනි.	2025 වාර්ෂික ස්ථාන මාරු සඳහා මෙම නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව.	චක්‍රලේඛය අනුව විධිමත් පරිදි ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වියදම් විෂයයන් 03 ක අහිතකර විචලනය රු.මිලියන 6.9 ක් වූ අතර එය සියයට 15 සිට සියයට 166 ක් දක්වා පරාසයක විය .	කාර්යය මණ්ඩල වියදම් ඉහළ යාම හා ඇස්තමේන්තු නොකරන ලද වියදම් දැරීමට සිදු වීම මෙයට හේතු වූ බව.	විචලනයන් අවම කර ගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් පරිදි සිදු විය යුතු අතර වියදම් පාලනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් අතර රු.මිලියන 16.99 ක් ප්‍රතිපාදන මාරුකිරීම් සිදුකර තිබූ අතර වැය විෂයයන්ට අදාළව නිවැරදිව අයවැය ප්‍රතිපාදන වෙන්කර නොගැනීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.	පුරෝකථනය කරන ලද වියදම්වලට අමතරව අනපේක්ෂිත වැය දැරීමට සිදු වූ බව.	වියදම් නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.